D137

# භාරතීය පාර්සි නාට්‍ය සහ සිංහල නූර්ති නාට්‍ය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්

කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ සිංහල අධ්‍යයන අංශයේ

දර්ශනසූරි (Ph.D.) උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන

පර්යේෂණ නිබන්ධනය - **2014**

UCLIB
583478
University of Colombo Library Sri Lanka

නම : එම්. ඩී. කුමුදිනී

ලියාපදිංචි අංකය : 2013/Ph.D./86

# හැඳින්වීම

1853 දී ඉන්දියාවේ බොම්බාය කේන්ද්‍රකර ගනිමින් පාර්සි නාට්‍ය කලාවත් 1877 දී කොළඹ නගරය මුල්කරගනිමින් නූර්ති නාට්‍ය කලාවත් බිහිවන්නේ දෙරටෙහිම බ්‍රිතාන්‍ය යටත්විජිත සම්පර්කය තුළදීය. ඒ අනුව මෙම නාට්‍ය කලාවන් දෙකම ආරම්භ වීමටත් විකාශනය වීමටත් සෘජුවම යටත්විජිත සංකල්පය මගින් දෙරටෙහිම ඇතිකළ අපරදිග සංස්කෘතියෙහි බලපෑම හේතුවිය. නූර්ති නාට්‍ය කලාව ආරම්භ වීමට දශක දෙකකටත් පෙර පාර්සි නාට්‍ය කලාව ආරම්භ වූයේ බ්‍රිතාන්‍ය සමාජය ඉන්දියාවේ ඇතිකළ ඉංග්‍රිසි ආධුනික රංග කලාව පැවති සංස්කෘතික පරිසරයකය. ඉන්දියාවේ සුළුතරයක් වූ පාර්සි ඩයස්පෝරාව යටත් විජිත පාලනය සමඟ පැවති සහසම්බන්ධතාවයත්, ඔවුන් සමඟ ඇතිකරගත් වාණිජවාදී පරමාර්ථයත්, ඉංග්‍රිසින් විසින් ඉන්දියාවේ ඇතිකළ මධ්‍යම පංතික සමාජය පාර්සිවරුන් විසින් නියෝජනය කිරීමත්, ඉංග්‍රිසින් ඇති කළ ඉංග්‍රිසි ආධුනික නාට්‍ය කලාව සමඟ සම්බන්ධ වීමත් ඉන්දියාවේ නව නාට්‍ය කලාවක් ඇති වීමට ප්‍රධානතම හේතුවිය. එවන් පරිසරයක් මත පාර්සි නාට්‍ය කලාව බිහිවන්නේ ඉංග්‍රිසි ආධුනික නාට්‍ය කලාව මඟින් ඉන්දියාවට හඳුන්වාදුන් ප්‍රොසිනියම් රංග ශාලාව මතිනි. පාර්සිවරුන් ඇතිකළ මෙම පාර්සි නාට්‍ය කලාව ආරම්භයේදී පාර්සිවරුන්ගේ ජාතික අනන්‍යතාව ප්‍රකට කරන කථා තේමාවන් යොදාගත්ත ද එහි නාට්‍ය සන්දර්භය හා රංග ශෛලිය බොහෝවිට කාලීන අපරදිග රංග කලා ආකෘතිවලට අනුව හැඩ ගැසුණි. ආරම්භයේදීම ගෝලියකරණ ආර්ථිකය තුළ වාණිජවාදී පරමාර්ථයෙන් ඇතිවූ මෙම නාට්‍ය කලාව බොම්බායේ වෙසෙන ස්වදේශිය බහුජාතීන් අතට පත්වීමත් සමඟ සමාගම් සංකල්පය පෙරදැරිකර ගනිමින් නාට්‍ය සම්ප්‍රදායක් ලෙස ගොඩනැගුණි. වාණිජත්වය මුල්කරගත් මෙම සමාගම් සංචාරක නාට්‍ය ව්‍යාපාරයක් ලෙස ක්‍රියාකළ අතර ඉන්දියාවේ ප්‍රධාන නගරවලට අමතරව දකුණු ආසියාවේ රටවලත් එංගලන්තයේත් සංචාරය කරමින් දැවැන්ත නාට්‍ය ව්‍යාපාරයක් බවට පත්විය.

යටත් විජිතකරණයේ ප්‍රතිඵලයක් ලෙස සංචාරක රංග කණ්ඩායම් 1856 සිට මෙරටට සංක්‍රමණය වූ අතර ඔවුහු කොළඹ අවට නගරබද ප්‍රදේශවල තාවකාලික රංගශාලා තනාගෙන තම ප්‍රදර්ශන ඉදිරිපත් කළහ. ඒ වන විට ජන නාටක කලාවකින් පෝෂණය වී සිටි දේශිය ප්‍රේක්ෂකයන්හට අපරදිග රංග කලාවන් රසවිඳිමටත් අපරදිග රංග කලා ආකෘතිවලට හැඩගැසීමටත් සුදුසු පරිසරයක් එමඟින් උදාවිය. ඒ අනුව මෙරට ඉංග්‍රිසි සමාජය විසින් පිහිටුවනු ලැබූ සමිති, ආරක්ෂක අංශ ඉදිරිපත් කළ රංග කාර්යයන් හා ඉංග්‍රිසි පාසල් ඉදිරිපත් කළ රංග කටයුතු හරහා අපරදිග රංග පසුබිමක් සමාජය තුළ ඇති වීම නව නාට්‍ය ආකෘතියක් බිහිවීමට සුදුසු පරිසරයක් ඇති කළේය. එවන්

කාලපරාසයක 1877 දි සංචාරක පාර්සි නාට්‍ය කාණ්ඩායමක් පැමිණ ඉදිරිපත් කළ රංග කාර්යය මෙරට ජනතාව වෙත ලබා දුන් නාට්‍යමය පරිචය තත් කාලීන නිර්මාණ ශිල්පීන්හට නව නාට්‍ය කලාවක් ගොඩනැංවීමට පෙලඹ වූ ප්‍රබල සාධයක් විය. ඒ අනුව ප්‍රොසිනියම් වේදිකා ආකෘතියක් මත බිහිවූ නූර්ති නාටය කලාව ශ්‍රී ලාංකේය නාට්‍ය ඉතිහාසයෙහි නව පරිච්ඡේදයක් සටහන් කරයි.

පාර්සි නාට්‍ය කලාව අපරදිග රංග ආකෘතින් උකහා ගනිමින් නිර්මාණය වුවද මේ වනවිට ප්‍රථම ආවේණික වූ රංග ආකෘතියක් ගොඩනගා ගැනීමට සමත්වූ අතර එම නව රංග ආකෘතිය මෙරට ජනතාවට අපරදිග රංගනයන්ට වඩා ඉක්මනින් සමීප විය. කථා කලාවේ සුවිශේෂිතාවයත්, භාෂාව, සංගීතය සහ රංග ආකෘතිය ශ්‍රී ලාංකේය ජනතාවගේ හදවතට බොහෝ සෙයින් සමීප වීම එයට ප්‍රධාන හේතුව විය. ඒ අනුව අපරදිග රංග පසුබිමක පාර්සි රංග කලාවේ ආකෘතිය වඩාත් සමීප කර ලමින් නව නාට්‍ය ක්‍රමය ඉදිරිපත් කිරීම යුගයේ අවශ්‍යතාව නියෝජනය කරන්නක් විය.

විවිධ ජාතීන් අතෙහි නිර්මාණය වූ පාර්සි නාට්‍ය මෙන් සංකීර්ණ ඉතිහාසයක් නූර්ති නාට්‍ය කලාවට නොමැති වුවද එය සම්ප්‍රදායක් ලෙස ගොඩනැගෙද්දී එයටම අනන්‍ය ආකෘතියක් නිර්මාණය කර ගන්නා ලදි. කෙසේ වෙතත් 1877 සිට 1936 දක්වා සංචාරක පාර්සි නාට්‍ය කණ්ඩායම් 18 ක් මෙරටට පැමිණි බවට දැනට ඇති මූලාශ්‍රගත තොරතුරු සාධක සපයන අතර ඒ සෑම අවස්ථාවකදීම නූර්ති නාට්‍ය කලාවට බලපෑම් කිරීමට පාර්සි නාට්‍ය කාණ්ඩයම් සමත් විය.

මේ අනුව පාර්සි නාට්‍ය සහ නූර්ති නාට්‍ය එකම කාල වකවානුවක යටත් විජිත සමාජ පසුබිම් මත කාලීන ජනතාවගේ රසවින්දනය හා අවශ්‍යතාව උදෙසා සමාජගත වූ නාට්‍ය කලාවන් දෙකක් වූ අතර නූර්ති නාට්‍ය කලාවේ ආරම්භයට මෙන්ම සංවර්ධනයටද එහි පරිහානියටද පාර්සි නාට්‍ය කලාව ඍජුව මෙන්ම වක්‍රවද බලපෑවේය. මෙම අධ්‍යයනයේ දී සිදු කරනුයේ මෙම නාට්‍ය කලාවන් දෙක වෙන් වශයෙන් අධ්‍යයනය කරමින් එහි සුවිශේෂිතා සහ සම්ප්‍රදායක් ලෙස ස්ථාපනය වෙද්දී මෙම නාට්‍ය කලාවන් දෙකට අනන්‍ය වූ ලක්ෂණ පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක් කිරීමය. එහිදී සම්ප්‍රදායන් දෙකෙහි ආරම්භයට හේතු වූ සමාජ පසුබිම, එහි සංවර්ධනය, කථා තේමාවන්, නාට්‍ය සන්දර්භය, නාට්‍ය ආකෘතිය, රංග ශෛලිය, වේදිකාව, ප්‍රාසංගික ලක්ෂණ, ප්‍රේක්ෂකයෝ සහ කාලීන සමාජ සංස්කෘතිය තුළ මෙම නාට්‍යවල සමාජ යථාර්ථයන් පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක් මෙහිදී සිදු කෙරේ.

## ❖ ගැටලුව අධ්‍යයනය කිරීමේ වැදගත්කම

ඉන්දියාවේ පාර්සි නාට්‍ය කලාව පිළිබඳවත් ලංකාවේ නූර්ති නාට්‍ය කලාව පිළිබඳවත් රටවල් දෙකෙහිම වෙන් වශයෙන් පර්යේෂණාත්මකව අධ්‍යයනයන් සිදුකර තිබුණද පාර්සි නාට්‍ය කලාව නූර්ති නාට්‍ය කලාවට කරන ලද බලපෑම පිළිබඳවත්, පාර්සි නාට්‍ය කලාව මෙරට ඉතිහාසය තුළ දැරූ වැදගත්කම පිළිබඳවත් සන්සන්දනාත්මක අධ්‍යයනයක් මේ වනතෙක් සිදුකර නොමැත. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ එම අඩුපාඩුව සපුරාලීමය.

ඇතැම් පර්යේෂකයන් විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිසියාකාර මූලාශ්‍රයන් මඟින් තහවුරු කර නොමැති අතර සාවද්‍ය තොරතුරු රැසක් ඒ හරහා නාට්‍ය ඉතිහාසයට එක් වී ඇත. මෙම අධ්‍යයනය මඟින් හැකි පමණින් ප්‍රාථමික මූලාශ්‍රය මඟින් දත්ත රැස්කර එම තොරතුරුවල නිරද්‍යතාව තහවුරු කරගනිමින් විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදුකිරීම තවත් එක් අරමුණකි.

පාර්සි නාට්‍ය කලාව පිළිබඳ මෙරට නාට්‍ය ඉතිහාසය සතුව පවතින තොරතුරු ප්‍රමාණය ඉතාම අල්පය. එසේ හෙයින් පාර්සි නාට්‍ය කලාවේ ආරම්භයේ සිට විකාශනය දක්වා ඓතිහාසික තොරතුරු මෙරට නාට්‍ය ඉතිහාසයට එක් කිරීම මෙම අධ්‍යයනයේ සිදුවන වැදගත් කර්තව්‍යයකි.

පාර්සි නාට්‍ය කලාව පිළිබඳ පර්යේෂකයින් අධ්‍යයන කිහිපයක් සිදුකර තිබුණද පාර්සි නාට්‍ය කලාව දකුණු ආසියාවේ නාට්‍ය කලාවට කළ බලපෑම පිළිබඳ නිවැරදි තොරතුරු ඉන්දියානු නාට්‍ය ඉතිහාසයටද සොයාගත නොහැකිව වැළලී ගොස් ඇත. මෙම අධ්‍යයනය මඟින් ලාංකේය නාට්‍ය කලාවට පාර්සි නාට්‍ය කලාවෙන් සිදුවූ බලපෑම් පිළිබඳව කරුණු අනාවරණය කිරීම නාට්‍ය කලා ඉතිහාසයට කෙරෙන ජාතික මෙහෙවරකි. පාර්සි නාට්‍ය කලාව හා නූර්ති නාට්‍ය කලාව ආරම්භයේ සිටම වාණිජවාදී නාට්‍ය කලාවන් දෙකක් වීම හේතු කොට ගෙන එම තත්ත්වය දෙරටෙහි යටත් විජිත කරණය වූ සමාජය වෙත එල්ල කරන ලද බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම තවත් එක් අරමුණකි.

පාර්සි සහ නූර්ති නාට්‍ය දශක අටකටත් වඩා වැඩිකාලයක් දෙරටෙහිම ජනතා ප්‍රසාදය දිනාගනිමින් ව්‍යාප්ත වීමටත් විශේෂයෙන් පාර්සි නාට්‍ය මෙරට ජනතාවගේ ජනාදරයට පාත්‍රවෙමින් සමාජගත වීමට හේතු වූ කරුණු විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ වැදගත් කමකි. එමෙන්ම තත් සම්ප්‍රදායන් දෙක මඟින් පිළිබිඹු වූ සමාජ යථාර්ථයන් කාලීන සමාජයට කෙතරම් බලපෑවේද යන්න අධ්‍යයනය කිරීම තවත් එක් අරමුණක් වෙයි.

## ❖ පර්යේෂණ ක්‍රමවේදය

ඉන්දියාවේ සහ ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ බිහි වූ නාට්‍ය සම්ප්‍රදායන් දෙකක් පිළිබඳව කරනු ලබන ඉතිහාසගත තොරතුරු ඇතුළත් සංසන්දනාත්මක අධ්‍යයනයක් බැවින් මෙහිදී විස්තරාත්මක පර්යේෂණ ක්‍රමවේදය (Descriptive Research) සහ විශ්ලේෂණාත්මක පර්යේෂණ ක්‍රමවේදය (Analytical Research) භාවිතා කරන ලදී.

## ❖ අධ්‍යයනයේ සීමා

මෙම අධ්‍යයනයේ විෂය සීමාව වූයේ පාර්සි නාට්‍ය කලාවත් නූර්ති නාට්‍ය කලාවත් ආරම්භවීමට බලපෑ සමාජ පසුබිමේ සිට එම කලාවන් දෙක සම්ප්‍රදායක් ලෙස ගොඩනැගීමත් එහි පරිහානිය ඇතිවීමත් දක්වා අතර සිදුවූ විවිධ ගතිකයන් ය. විශේෂයෙන්ම පාර්සි නාට්‍ය කලාව සංචාරක ව්‍යාපාරයක් ලෙස ලංකාවට සංචාරය කිරීමෙන් ලාංකිය නව නාට්‍ය කලාවක් බිහිවීමට මෙන්ම එම කාලාවේ වර්ධනයට මෙන්ම පසුබෑම්වලට ද එල්ලවූ බලපෑම් පිළිබඳ සාකච්ජා කිරීම මෙහි විෂය සීමාවට අයත් වේ.

පාර්සි නාට්‍ය කලාව ඉන්දියානු භූගෝලීය කලාපය තුළ ක්‍රියාත්මක වූ ආකාරයත් ලංකාවේ සංචාරය කළ භූගෝලීය වපසරියත්, නූර්ති නාට්‍ය කලාව ලංකාව තුළ ක්‍රියාත්මක වූ ආකාරයත් මෙම අධ්‍යයනයේ භූගෝලීය සීමාව වේ.

## ❖ අධ්‍යයනයේ මූලාශ්‍ර

මෙම අධ්‍යයනය ඉතිහාසගත කරුණු මත පදනම් වීම හේතුවෙන් ප්‍රාථමික මූලාශ්‍ර මෙන්ම ද්විතියික මූලාශ්‍ර ප්‍රධාන දත්ත ලබාගත් මූලාශ්‍රය වෙයි. එහිදී සමකාලීන පුවත්පත් සහ ආයතන තොරතුරු මූලික විය. එවැනි මූලාශ්‍ර අබලි තත්ත්වයේ පැවතීමත් සොයා ගැනීමට ඇති දුෂ්කරතාවත් හේතුවෙන් දත්ත සොයා ගැනීමට දීර්ඝ කාලයක් ගත කිරීමට සිදුවිය. ඒ අතර පාර්සි නාට්‍ය හා නූර්ති නාට්‍ය පිටපත් මෙම අධ්‍යයනයේ වැදගත් මෙහෙයක් ඉටුකළ මූලාශ්‍ර වෙයි.

කෙසේ වුවද හැකිතාක් ප්‍රාථමික මූලාශ්‍ර මගින් දත්ත රැස්කිරීම මෙහිදී සිදුකළ අතර බොම්බායේ සහ ලංකාවේ ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව බොම්බායේ ප්‍රාදේශීය රාජ්‍ය ආයතන, බොම්බායේ විශ්ව විද්‍යාල පුස්තකාලය, රාජස්ථාන් නාට්‍ය ඇකඩමිය, දිල්ලි නාට්‍ය පාසල ලංකාවේ පුස්තකාල, පෞද්ගලික ලිපිගොනු මේ සඳහා මූලාශ්‍ර සපයාගත් ප්‍රධාන ආයතන විය.

සමහර මූලාශ්‍රවල මුල් පිටපත්වල මුල් පිටු ඉරීගොස් තිබූ හෙයින් එහි කතුවරුන්ගේ සහ රචිත වර්ෂ සොයා ගැනීම නොහැකි වූ අවස්ථා කිහිපයක් විය. එසේ හෙයින් මූලාශ්‍ර දැක්වීමේදී සමහර අවස්ථාවල වර්ෂය හෝ කතුවරයාගේ නම සඳහන් කිරීමට නොහැකි වී ඇත. ප්‍රාථමික මූලාශ්‍ර භාවිත නොකළ හැකි අවස්ථාවල ද්විතීය මූලාශ්‍ර භාවිත කළ අතර පාර්සි සහ නූර්ති නාට්‍ය පිළිබඳ සිදුකළ පර්යේෂණාත්මක ග්‍රන්ථ මෙන්ම එම විෂය මූලික කොට ඉදිරිපත්වී තිබූ සාහිත්‍ය ග්‍රන්ථ මෙම අධ්‍යයනයේ දී විශාල පිටිවහලක් විය.

පාර්සි නාට්‍ය කලාව සතු මූලාශ්‍ර ගුජරාති පාර්සි, උර්දු, හින්දි භාෂාවලින් රචනා වී තිබීම හේතුවෙන් ඒවා පරිවර්තනය කිරීමේදී විවිධ දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදුවිය. එකම නාට්‍යය වුවද විවිධ භාෂාවලට පරිවර්තනය වීමේදී නම් වල බොහෝ වෙනස්කම් දැකිය හැකිය. මෙම අධ්‍යයනයේ දී ප්‍රවීන භාෂා පරිවර්තකයින් කිහිප දෙනෙකුගේම සහාය ලබා ගනිමින් එම නම් හැකිතාක් නිවැරදි ලෙස යොදා ගෙන ඇති අතර මෙහි දක්වා ඇති සෘජු උද්ධෘත එම පරිවර්තනවලින් ලබාගත් ඒවා වෙයි.

පාර්සි සහ නූර්ති නාට්‍ය පිටපත් බොහෝමයක් අමුද්‍රිත අත්පිටපත් හා දළ පිටපත් ලෙස පවතින අතර පෞද්ගලික ලිපිගොනුවලින් එම පිටපත් කිහිපයක් සොයා ගත හැකිවිය. එමෙන්ම සම්මුඛ සාකච්ඡා මගින් සොයාගත් දත්තද මෙහිදී ප්‍රයෝජනවත් විය. අන්තර්ජාලය ඔස්සේ සොයාගත් මූලාශ්‍ර ද මෙහිදී වැදගත් මෙහෙයක් ඉටුකළ අතර සමස්ත අධ්‍යයනයේ දී වැඩි ඉඩකඩක් ප්‍රාථමික මූලාශ්‍රවලට ලබාදී ඇත.

## ❖ අධ්‍යයනයේ සැලැස්ම

මෙම අධ්‍යයනයේ පළමු පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරෙනුයේ පාර්සි නාට්‍ය කලාව බිහිවීමට බලපෑ සමාජ සංස්කෘතික පරිසරයයි. බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ ආරම්භ වූ පාර්සි නාට්‍ය කලාව පාර්සි ප්‍රජාව මුල් කරගෙන බිහිවීම හේතුවෙන් ඉන්දියාවේ සුළුතරයක් වූ පාර්සි ප්‍රජාවගේ සමාජ සංස්කෘතික ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයකින් තොරව මෙම විෂයට ළගාවිය නොහැකිය. එසේ හෙයින් පාර්සිවරු පාර්සි ඩයස්පෝරාවක් ලෙස ඉන්දියාවේ ජන සමාජය තුළ ජාතියක් ලෙස ගොඩනැගුණු ආකාරයත් පාර්සි නාට්‍ය කලාවක් ගොඩනැංවීමට ඔවුන් කාලීන සමාජ පරිසරය සමඟ දැක්වූ සහසබඳතාවත් මෙහිදී අධ්‍යයනය කෙරේ. පාර්සි නාට්‍ය කලාව ඕපපාතිකව පහළවූවක් නොවන බැවින් එම නාට්‍ය කලාව බිහිවීමට බලපෑ අධිරාජ්‍ය යුගයේ රංග කලාවන් හරහා ලැබුණු පරිචයන් පිළිබඳවත් ඉංග්‍රීසි ප්‍රොසීනියම් රංග ශාලාව මතින්ම නව නාට්‍ය කලාවක්

බිහිවීමට පරිසරය සැකසුණු ආකාරයක් පළමු පරිච්ඡේදයෙන් අධ්‍යයනය කරනු ලබයි. විශේෂයෙන් ඉංග්‍රීසි ආධුනික රංග කලාව පිළිබඳ දීර්ඝ විස්තරයක් මෙහිදී සිදු කරනුයේ කාලීන සමාජ තුළ අපරදිග නාට්‍ය කලාවේ ආභාසය පැතිරීම පිළිබඳ අවබෝධයක් ලබාගැනීමත් ඒ හරහා ජනතාවගේ නව නාට්‍ය ශෛලික අවශ්‍යතා පිළිබඳ හඳුනාගැනීමත් සඳහාය. භාරතීය ජන නාට්‍ය කලාවද සංස්කෘත නාට්‍ය කලාවේද ආභාසය පාර්සි නාට්‍ය බිහිවීමට පරිසරය සකස් කළ ආකාරය මෙහිදී අධ්‍යයනයට බඳුන් වන අතර ඉංග්‍රීසි ආධුනික නාට්‍ය කලාවේ පරිහානියත් සමඟ එම වේදිකාව මතින්ම පාර්සි නාට්‍ය කලාව ආරම්භ වීම මෙන්ම එය ශක්තිමත් අඩිතාලමක් මත ගොඩනැගෙන ආකාරයත් මෙම පරිච්ඡේදයෙන් අධ්‍යයනය කර ඇත.

දෙවන පරිච්ඡේදය මඟින් නූර්ති නාට්‍ය කලාවේ ආරම්භයට බලපෑ සමාජ සංස්කෘතික පරිසරයේ බලපෑම පිළිබඳව සාකච්ඡා කර ඇත. නූර්ති නාට්‍ය කලාවේ බිහිවීමට අපරදිග සංචාරක රංග කණ්ඩායම්වල රංග කටයුතු හා සමගාමීව මෙරට ඉංග්‍රීසි සමාජය තුළ ඇති වූ සමිති මඟින් ඉදිරිපත් කළ රංග කටයුතු, යටත්විජිත පාලනයත් සමග මෙරට බිහි වූ ඉංග්‍රීසි පාසල් පද්ධතිය පාදක කර ගනිමින් ඉදිරිපත් වූ රංග කටයුතු ද ඒ හරහා මෙරට ජනතාවට ජනනාටක කලාව අබිබවමින් නව රංග කලා සංස්කෘතියක් බිහිවීමට පරිසරය සකස්වූ ආකාරය මෙහිදී සාකච්ඡාවට බඳුන් වී ඇත. එම තත්ත්වය යටතේ 1877 දී මෙරටට පැමිණි පාර්සි නාට්‍ය කණ්ඩායමේ ඉදිරිපත් කිරීම් දේශීය ජනතාවට අපරදිග රංග කටයුතුවලට වඩා සමීප වීම හේතුවෙන් එයද නව නාට්‍යකලාවක් බිහිවීමට තවත් පූර්වාදර්ශයක් විය. සමස්ත අධ්‍යයනයේ ප්‍රධාන මාතෘකාවක් වන පාර්සි නාට්‍ය කලාවේ ආකෘතිය හා සංවර්ධනය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සඳහාත් දේශීය නාට්‍යකලාවේ වර්ධනයට පාර්සි නාට්‍ය කලාවේ ආභාසය පිළිබඳ පුළුල් කතිකාවක් ගොඩනැගීම සඳහාත් 1877 සිට 1936 දක්වා මෙරටට පැමිණි පාර්සි නාට්‍ය කණ්ඩායම්හි ඉදිරිපත් කිරීම්වල සාරාංශයක් මෙහිදී ඉදිරිපත් කර ඇත.

මෙම පරිච්ඡේදයේ අපරදිග රංග කටයුතු පිළිබඳ සැලකිය යුතු විමර්ශනයක් සිදුකරනු ලැබුවේ. එම රංග කටයුතු වල ස්වභාවයන්ට වඩා දේශීය ජනතාව පාර්සි නාට්‍ය කලාවේ රංග කටයුතුවලට වඩා වැඩි නැඹුරුවක් දැක්වීමේ ප්‍රවණතාව මතුකර දැක්වීම සඳහා බව අවධාරණය කරන අතර මේ සියලු අභියෝග හමුවේ ඒ වන විට දේශීය ජනතාව රසවිඳි ජන නාටක කලාව වූ නාඩගම්වල පරිහානිය සටහන් වීමත් ජනතාවට නව නාට්‍ය කලාවක අවශ්‍යතාව දැනීමත් එම අවශ්‍යතාවන් මත නව නාට්‍ය කලාවක් ආරම්භ වීමත් මෙම පරිච්ඡේදය මඟින් විමර්ශනය කර ඇත.

පාර්සි නාට්‍ය කලාව හා නුර්ති නාට්‍ය කලාවේ සංවර්ධනය හා විකාශනය පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් තුන්වන පරිච්ඡේදයේදි සිදු කරනු ලබයි. එහිදි මෙම සම්ප්‍රදායන් දෙකෙහි සමාගම් ඇතිවීම එහි ක්‍රියාකාරීත්වය සහ ඒවායේ පරිහානිය සිදු වීමත් පාර්සි නාට්‍ය කලාවේ සංවර්ධනය සිදුවූ ආකාරයත් විග්‍රහ කර විශ්ලේෂණය කර ඇති අතරම නුර්ති නාට්‍ය කලාවේ සංවර්ධනය හා විකාශනයට පාර්සි නාට්‍ය කලාවේ බලපෑම සිදුවූ ආකාරය ද මෙහි දි විශ්ලේෂණය කර ඇත. මෙම සම්ප්‍රදායන් දෙකෙහි ශක්තිය රදා පැවතුණේ නාට්‍ය රචකයන්ගේ නිර්මාණ මතය. එසේ හෙයින් පාර්සි හා නුර්ති නාට්‍ය රචනා කළ රචකයන්ගේ පසුබිම ඔවුන්ගේ නිර්මාණවල ස්වභාවයත් පිළිබඳ මෙහිදි අධ්‍යයනය කර ඇත. සමාගමක් ලෙස සංවර්ධනය වීමේදි ප්‍රචාරණ කටයුතු ප්‍රේක්ෂකාගාර මිල ගණන් හා එහි ක්‍රියාකාරීත්වය හා කලාවක් ලෙස සංවර්ධනය වීමේ දි විචාර කලාවේ ඇති වැදගත් කම ද මෙහිදි අවධාරණය කරමින් දශක අටකට වඩා පාර්සි හා නුර්ති නාට්‍ය කලාවේ සංවර්ධනය හා විකාශනය සිදු වූ අයුරු පිළිබඳව සංසන්දනාත්මක විග්‍රහයක් සිදුකර ඇත.

හතරවන පරිච්ඡේදයේ දි සාකච්ඡාවට බදුන්වන්නේ පාර්සි හා නුර්ති නාට්‍යයෙහි නිර්මාණාත්මක ව්‍යුහයේ ස්වරූපය පිළිබඳවය. එහිදි මෙම නාට්‍ය සඳහා පාදක වූ තේමා, නාට්‍ය සන්දර්භයේ ආකෘතිය හා අන්තර්ගතයේ ස්වරූපයන් පිළිබඳවත් ගීත නාටක ආකෘතිය, භාෂා භාවිතය පිළිබඳ අධ්‍යයනය කරමින් නාට්‍ය මඟින් පිළිබිඹු වන සුඛාන්ත හා ශෝකාන්ත යන ලක්ෂණ පිළිබඳවද විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් සිදු කරනු ලබයි.

දශක අටකටත් වඩා වැඩි කාලයක් පාර්සි සහ නුර්ති නාට්‍ය කලාව ඔසවා තබා තැබීමට එහි ප්‍රාසංගික ලක්ෂණ ප්‍රධාන විය. පස්වන පරිච්ඡේදයේ දි මෙම සම්ප්‍රදායන් දෙකෙහි ප්‍රාසංගික ලක්ෂණ ක්‍රියාත්මක වූ ආකාරය සංසන්දනාත්මක අධ්‍යයනයකට ලක් කර ඇත. දෙරටෙහිම ප්‍රොසිනියම් වේදිකාවේ වර්ධනය හා ඒ හා සමගාමීව පසුතල දර්ශන වේදිකා තාක්ෂණය වෙස් මෝස්තර නිර්මාණය, අංග රචනය, රංගාලෝකය පිළිබඳ විශ්ලේෂණයක් සිදුකර ඇත. ඒ මඟින් පිළිබිඹු වූ යථාර්ථවාදි හා ස්වාභාවික රීතිය පිළිබඳ විශ්ලේෂණයක්ද මෙහි දි සිදු කර ඇත.

පාර්සි හා නුර්ති නාට්‍ය කලාව මඟින් පිළිබිඹු වන සමාජ යථාර්ථයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් හයවන පරිච්ඡේදයේ දි සිදු කෙරෙන අතර එහිදි මෙම සම්ප්‍රදායන් දෙකෙහි නාට්‍ය තේමා මඟින් කාලීන සමාජ ගතිකයන් ප්‍රකට කළ ආකාරය සාකච්ඡා කර ඇත. විශේෂයෙන්ම යටත් විජිතකරණයේ බලපෑම මත දෙරටෙහිම

ඇති වූ ජාතික ව්‍යාපාරයේ කැඩපතක් ලෙස මෙම නාට්‍ය සම්ප්‍රදායන් දෙකම ක්‍රියා කළ ආකාරය පිළිබඳ සංසන්දනාත්මක විමර්ශනයක් මෙහිදී ඉදිරිපත් කරනු ලැබ ඇත.

පාර්සි සහ නූර්ති නාට්‍ය කලාවන් ආරම්භවීමේදී, වර්ධනය වීමේදී සහ සම්ප්‍රදායන් දෙකම සන්සන්දනාත්මකව විමර්ශනය කිරීමේදී මතු වුණු සුවිශේෂ කරුණු නිගමන යටතේ දක්වා ඇත.

මෙම අධ්‍යයනයේදී උපුටාගැනීම් දැක්වීමේදී හා ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය පිළියෙල කිරීමේදී ඇමරිකන් මනෝවිද්‍යා සංගමය (American Psychological Association - APA) ඉදිරිපත්කර ඇති ක්‍රමවේදය භාවිත කර ඇත. එහිදී අමතර පැහැදිලි කිරීම් පෙළෙහි අදාළ ස්ථානයට අංකයක් යොදා එම පැහැදිලි කිරීම ආශ්‍රිතග්‍රන්ථ නාමාවලියට පෙර සටහන් යටතේ දක්වා ඇත.

මෙහි සඳහන් කරුණු තහවුරු කිරීම සඳහා එයට අදාළ මූලාශ්‍රයන්හි මුල්පිටපත් වල ඡායා පිටපත්, උපග්‍රන්ථ යටතේ ඇමුණුම් ලෙස දක්වා ඇත.